# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1870/16 – 2014 ජූලි 08 වැනි අඟහරුවාදා – 2014.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුක්කලම්පිඩ්ඩි බටහිර එම්එන්/64 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සම්පෙතුරෙයි ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එම්ජ්/එම්එන්එන්/2013/091 හා 2013.12.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.7235ක් පමණ වූ මීනරක්කාඩු නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මීනරක්කාඩු – ප්‍රමාණය: හෙක්. 2.7235 ක් පමණ

උතුරට: මන්නාරම රදගුරුතුමා සහ පුදුකුඩුඉරිප්පු ධීවර සමිතිය හිමිකම් කියන ඉඩම සහ මුහුද; නැගෙනහිරට: මුහුද සහ මන්නාරම රදගුරුතුමා, අබ්දුල් හලීම්, මොහොමඩ් අලි ජවුෆර් සහ මොහොමඩ් අබ්දුල් කාදර් හිමිකම් කියන ඉඩම; දකුණට සහ බටහිරට: මන්නාරම රදගුරුතුමා, අබ්දුල් හලීම්, මොහොමඩ් අලි ජවුෆර් සහ මොහොමඩ් අබ්දුල් කාදර් හිමිකම් කියන ඉඩම.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2013/ඩී/299.
2014 ජුනි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 688

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹුක පත්තුව සුළු කොට්ඨාසයේ, නර්තනගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජ්/එච්ආර්එන්/93/276 හා 1993.08.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් දික්හේන නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – දික්හේන – ප්‍රමාණය: හෙක්. 0.7035

උතුරට: රක්ෂිත වනය; නැගෙනහිරට: නිවාසවලට යන පාර; දකුණට: ප්‍රධාන පාරේ සිට පාර සහ සීමාසහිත හොරණ නිවාස සමුපකාර සමිතිය හිමිකම් කියන ඉඩම; බටහිරට: මුණගම සිට ප්‍රධාන පාරට පාර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 3ජේ/91/ඒ/179.
2013 ජූලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 689